# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2019

### ව්‍යාපාර නීතිය

### පැ තුනයි (03)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. (අ) 'භාණ්ඩ විකිණීම ආශ්‍රිත අවධානම මාරුවීම හා අදාළ රීතීන්, සැමවිටම පිළිගනු ලබන්නේ අවධානම දරාගන්නා පාර්ශ්වය වෙත එය පැවරෙන බවයි.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ බලධාරී නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) වැල්ලවත්තේ සිටින විජේදාස, බොරැල්ලේ පිහිටි Ceylon Tea Ltd වෙතින් තේ කිලෝ 100 ක් ඇණවුම් කළේය. කුරුණෑගල පිහිටි අමරදාස සහ සමාගමත් අනුරාධපුරයේ පිහිටි රයන් සහ සමාගමත් පිළිවෙලින් තේ කිලෝ 200 හා 400 බැගින් Ceylon Tea Ltd වෙතින් ඇණවුම් කළෝය. Ceylon Tea Ltd විසින් දැව පීප්ප (casks) තුළ තේ කිලෝ 700 ක් අසුරා ගැනුම්කරුවන් තිදෙනා වෙත ලොරි රථයකින් ප්‍රවාහනය කරනු ලැබිණ. විජේදාසගේ ඇණවුම වැල්ලවත්තේදී බාර දුනි. කුරුණෑගල වෙත ගමන් කරන අතරතුර ලොරි රථය, අනතුරකට මුහුණ දුන් අතර ඉතිරි තේ බෙදාහැරීමට නොහැකි විය. උක්ත සංසිද්ධීන්ට අදාළව රයන් සහ සමාගමේ අධ්‍යක්ෂවරු ඔබෙන් නීති උපදෙස් පතයි.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ බලධාරී නඩු තීන්දු නීතිය ඇසුරින් ඔවුන් වෙත උපදෙස් දෙන්න.

02. තිලක්, රු. 10,000 ක වටිනාකමකින් යුත් චෙක්පත්‍රයක් අණකර එය 'ගණුදෙනු කළ නොහැකිය' යනුවෙන් රේඛනය කළේය. චෙක්පත්‍රයේ ගෙවීම් ලාභියා ලෙස ඩේවිඩ් ප්‍රනාන්දුගේ නම යොදන ලෙස ඔහු සිය ලිපිකරු වන මෙරිල් වෙත උපදෙස් දුන්නේය. මෙරිල්, සමන් වෙත පෞද්ගලික ණයක් ගෙවිය යුතු විය. ඔහු චෙක්පත්‍රයේ වටිනාකම රු.100,000 ලෙස වෙනස් කර එය සමන් වෙත ගෙවිය යුතු ආකාරයට සකස් කළේය. පසුව මෙරිල්, චෙක්පත්‍රය සමන් වෙත බාර දුනි. සමන්, එම චෙක්පත්‍රය, වටිනාකම ගෙවා එය ලබාගත් බිමල් වෙත ගණුදෙනු කළේය. ගෙවීම් ලබාගැනීම සඳහා බිමල්, චෙක්පත්‍රය ඉදිරිපත් කළ විට බැංකුව ගෙවීම් සිදුකිරීම ප්‍රතික්ෂේප කළේය.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු උපුටා දක්වමින් පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සාකච්ඡා කරන්න.

03. 'Seamy' යෝගට් නැවුම් බවින් යුක්ත සහ යමෙකුගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ඉහළ නංවාලන බවට සායනිකව හා විද්‍යාත්මකව තහවුරු කර ඇති බවට එම යෝගට් ඇසුරුමෙහි වන සඳහනක් මාෂා දුටුවාය. නොමිලේ ලබාදුන් සාම්පලයක් ඇය ආහාරයට ගත් අතර එහි රසය නැවුම් බවින් යුක්ත විය. මාෂා සිය පවුලේ පරිභෝජනය සඳහා යෝගට් විස්සක් මිලදී ගත්තාය. මෙම යෝගට්වලින් දෙකක් පරිභෝජනය කිරීමෙන් අනතුරුව ඇයගේ පස් වියැති පුතු වමනය කළ අතර දරුණු බඩේ අමාරුවකින් පීඩා වින්දේය. මාෂා සිය කුඩා පුතුව රෝහලට ඇතුළත් කළාය. මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු යෝගට් පරිභෝජනය හේතුවෙන් මෙම බඩේ කැක්කුම හටගත් බව වෛද්‍යවරයා මාෂා වෙත පැහැදිලි කළේය.

මාෂා යෝගට් මිලදී ගත් අවස්ථාවේදී 'Creamy' යෝගට් වෙළඳ නාමය යටතේ කටයුතු කරන වෙනත් යෝගට් නිෂ්පාදකවරයෙක්, 'Seamy' යෝගට් ලිමිටඩ්ට එරෙහිව තම ලියාපදිංචි වෙළඳ සලකුණ උල්ලංඝනය කිරීම හේතුවෙන් කොළඹ මහාධිකරණයෙන් තහනම් නියෝගයක් ලබාගෙන ඇති බව පසුව මාෂා දැනගත්තාය. 'Seamy' යෝගට් ලිමිඩට්ට එරෙහිව නඩු පැවරීමට මාෂාට අවශ්‍ය වෙයි.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ බලධාරි නඩු තීන්දු නීතිය ඇසුරින් ඉහත අවස්ථාව විවේචනාත්මකව අගයන්න.

04. පහත අවස්ථාවන්හි පැනනැඟී ඇති නෛතික කාරණා සාකච්ඡා කරන්න:

(අ) චෙක්පත්‍රයක පිටසන්කරුවකු වන පියල්, එය අගනා ප්‍රතිෂ්ඨා විරහිතව ලාල් වෙත පවරයි. ලාල් ද එය අගනා ප්‍රතිෂ්ඨා විරහිතව සේන වෙත පවරයි. සේන, එය අගනා ප්‍රතිෂ්ඨාවක් මත පෙරේරා වෙත පවරයි. පෙරේරා එය අගනා ප්‍රතිෂ්ඨා විරහිතව මාලා වෙත පවරයි.

මාලාට චෙක්පත්‍රයේ වටිනාකම පෙරේරා හෝ පියල් වෙතින් අයකරගත හැකිදැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ආ) භානු වෙත ගෙවිය යුතු චෙක්පත්‍රයක් සොරකම් කරන අනිල්, එම බිල්පත්‍රය සිරිල් වෙත පැවරීම සඳහා භානුගේ අත්සන වංචනිකව යොදයි. සිරිල් චෙක්පත්‍රය සඳහා වටිනාකම ගෙවන අතර එම බිල් පත්‍රය ඔහු ලබාගත්තේ සොරෙකුගෙන් බව නොදනී. සිරිල්, ගෙවීම් ලබාගැනීම සඳහා චෙක්පත්‍රය ඉදිරිපත් කළ විට එය අහරු වේ. චෙක්පත්‍රයෙහි සියලුම පූර්ව පාර්ශ්වයන්ට එරෙහිව චෙක්පත්‍රය බලාත්මක කිරීමට සිරිල් අදහස් කරයි.

සිරිල් වෙත ඇති නෛතික අයිතිවාසිකම් පිළිබඳ ඔහුට උපදෙස් දෙන්න. අනිල්, දරන්නාට ගෙවිය යුතු බිල්පත්‍රයක් සොරකම් කර එය සිරිල් වෙත ලබාදුන්නේ නම් ඔබේ පිළිතුර වෙනස් වේද?

(ඇ) භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට මොහාන් ඩයස්ගේ වාසිය පිණිස රුපියල් 10,000 ක චෙක්පතක් අණකරයි. ඩයස්, එම චෙක්පත්‍රය 'අමල් ප්‍රනාන්දුට පමණක් ගෙවනු' යනුවෙන් පිටසන් කර අමල් ප්‍රනාන්දු වෙත භාර දෙයි. අමල් විසින් රමන් වෙත ගෙවිය යුතු ණයක් පියවීම සඳහා එම චෙක්පත්‍රය ඔහුට පැවරීමට අමල් ප්‍රනාන්දු දැන් අදහස් කරයි.

(ඈ) "චෙක්පත්‍රයක් 'ආදායකයාගේ ගිණුමට පමණයි' යන වචන එක්කොට රේඛනය කිරීම මගින් අණකරුව වඩා ආරක්ෂා කරයි." ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? අණකරු වෙත වඩා ආරක්ෂාවක් සැපයෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

05. (අ) මාතර සිටින අඹ ගැණුම්කරුවෙකු කුණාටු හේතු කොට ගෙන ප්‍රමාද වූ මුහුදු ගමනකින් අනතුරුව කොළඹ වරායට පැමිණි, මාතර දී භාරදිය යුතු වූ විදේශීය අඹ තොගයක් මිලදී ගත්තේය. ඒ වන විටත් ආරම්භව පැවති දුම්රිය වර්ජනය හේතුවෙන් එම අඹ තොගය එහි ගමනාන්තය වූ මාතර කරා රැගෙන යාම තව දුරටත් ප්‍රමාද විය හැකි බැවින් එම අඹ තොගය වහාම කොළඹ මැනිං මාකට්හි දී විකිණීමට දුම්රිය සමාගම තීරණය කළේය.

කොළඹ දී ලද මිලත් සහ මාතර වෙළඳපොල මිලත් අතර වෙනසට නියෝජිතයකු ලෙස දුම්රිය සමාගම වගකිව යුතුද යන්න සාකච්ඡා කරන්න.

(ආ) 'ප්‍රකාශිතව හෝ ව්‍යංගව බලය අභිනියෝජනය කිරීමට අවසර තිබෙ නම් මිස නියෝජිතයකු ප්‍රධානියා වෙත සිය කාර්යය පෞද්ගලිකව සම්පූර්ණ කිරීමේ යුතුකමින් බැඳී සිටියි.'

විනිශ්චිත තීන්දු ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

06. "මුහුදු ප්‍රවාහකයකුගේ වගකීම පාලනය වන රීතීන්, අන්තර්ජාතික නාවික සම්මුතීන් හි ප්‍රධාන කොටස වේ. එම රීතීන් මගින් අවධානම බෙදා වෙන්කිරීමත් (allocation) ප්‍රවාහකයා හා භාණ්ඩ හිමිකරුගේ යහපත අතර අයිතිවාසිකම් හා වගකීම් තුලනය කිරීමත් විධිමත් කරයි. කාලය සමගින් වර්ධය වූ ව්‍යවහාර තුළින් නෞභාර පත්‍රය මත වන අවධානම ප්‍රවාහකයා සහ භාණ්ඩ තොගයේ යහපත අතර බෙදා වෙන්කිරීමේ ප්‍රයත්නයක් පිළිබඳව සාක්ෂි පෙන්නුම් කරයි."

ප්‍රකට ජාත්‍යන්තර රීතීන්, ශ්‍රී ලංකාවේ 1982 අංක 21 දරණ මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම පිළිබඳ පනත සහ විනිශ්චිත තීන්දු ඇසුරින්, අන්තර්ජාතික වෙළඳාමෙහි ප්‍රධාන ලේඛනය වන නෞභාර පත්‍රයෙහි විශේෂ ලක්ෂණ සහ කර්තව්‍යයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

07. අදාළ නෛතික මූලධර්ම සහ නඩු තීන්දු නීතිය ඇසුරින් පහත පාර්ශ්වයන් වෙත උපදෙස් දෙන්න:

(අ) ශ්‍රී ලංකාවෙහි ප්‍රකට රූපවාහිනී සමාගමක් වන එපිස්ටන් (Episton), අඟල් 44' පැතලි තිරය සහිත රූපවාහිනි යන්ත්‍ර 1000 ක් රුපියල් මිලියන 5.5 ක මුදලකට Sony වෙතින් ඇණවුම් කළ අතර ඒවා CIF නියම මත කොළඹ වරාය වෙත ලබා දිය යුතු විය. Sony, එම රූපවාහිනී යන්ත්‍ර ඇණවුම ජපානයේ අකීටා

වරායෙන් නැව්ගත කළ අතර පසුව Episton විසින් නම් කරන ලද Costerita Express නම් නෞකාවට භාණ්ඩ පැටවීය. Costerita Express හි භාණ්ඩ පැටවීම භාරව සිටින සේවකයා, භාණ්ඩ විකිණීමේ ගිවිසුමෙහි එකඟ වූ පරිදි එම රූපවාහිනී යන්ත්‍රවල තිරයේ ප්‍රමාණය අඟල් 44' නොව අඟල් 40' බව වටහා ගැනීමට අසමත් විය. කෙසේ වුවත්, නෞකාවේ නෞභාර පත්‍රයෙහි පටවන ලද රූපවාහිනී යන්ත්‍රවල ප්‍රමාණය අඟල් 40' ලෙස දක්වා තිබුනි. Episton සමාගම රූපවාහිනී යන්ත්‍ර සඳහා Sony වෙත ගෙවීම සිදු කිරීම පිණිස නෞභාර පත්‍රය පිළිගත්තේය.

මුහුදු ගමන අතරතුර Costerita Express හි භාණ්ඩ තැන්පත් කර තිබූ කොටසක ගින්නක් හටගත් අතර ගින්න මැඩපැවැත්වීමට ප්‍රයත්න දැරුවද Episton හි ඇණවුමෙන් 20% ක පමණ ප්‍රමාණයක් හානියට පත්විය. Costerita Express කොළඹට පැමිණි විට නෞභාර පත්‍රයේ සිදුව තිබූ වරද අනාවරණය විය. Episton රූපවාහිනී සමාගම Costerita Express හි හිමිකරුවන්ට එරෙහිව අලාභ අයකර ගැනීමට නඩු පැවරුවේය.

Costerita Express හිමිකරුවන් ඔබෙන් උපදෙස් පතයි.

(ආ) 'Spice Cost' නම් වූ ඕස්ට්‍රේලියානු බහුජාතික සමාගමක්, ශ්‍රී ලංකාවේ සමාගමක් වන 'Ceylon Spice' වෙතින් ලංකා කුරුඳු කිලෝ 250 ක් FOB නියම යටතේ මිලදී ගත් අතර ගැණුම් මිලෙන් අඩක් කලින් ගෙවනු ලැබීය. ගණුදෙනුකාර සමාගමක් කුරුඳු ඇසුරුම් කිරීම භාර ගත් අතර කොළඹ වරායේ නම් කරන ලද නැවකට එම භාණ්ඩ තොගය පැටවීමේ අරමුණ සඳහා 'Spice Cost' හි නම සහ ලිපිනය පෙට්ටි මත සළකුණු කරන ලදි. බර වාහන රියදුරන්ගේ වර්ජනයක් හේතුවෙන් සාධාරණ කාලයක් තුළ පැටවීම සඳහා ඇසුරුම් යැවීමට ගණුදෙනුකාර සමාගම අසමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස එකඟ වූ පරිදි භාණ්ඩ නැව් ගත කිරීමට ගණුදෙනුකාර සමාගම අසමත් විය. භාණ්ඩ නැව්ගත කිරීම සඳහා 'Spice Cost' වගකිව යුතු බව තර්ක කරමින් 'Ceylon Spice' සමාගම ඉතිරි ගැණුම් මිල ඉල්ලා සිටියි.

'Spice Cost' සමාගමේ නීති උපදේශක ඔබ යැයි උපකල්පනය කරමින් ඔබේ සේවාදායකයාගේ වාසිය පිණිස තර්ක සංග්‍රහිත කරන්න.

○०○०○०○०○०○०○०